

# පරිසරයට හිතැති "සෙවණත"

ගෝලීයකරණය හමුවේ වේගයෙන් වර්ධනය වන කාර්මික අංශයේ ක්‍රියාකාරකම් හේතුවෙන් වර්ධනය අවම වනුයේ ස්වභාවික පරිසරයේ ය. මිනිසා සිය අවශ්‍යතා සඳහා ස්වභාවික පරිසරය පරිවර්තනය කිරීමට යෑමේදී පරිසරයට සිදුවන හානි ප්‍රමාණය ඉතා ම විශාල ය. නාගරීකරණය හමුවේ මිනිසා පරිසරයට හානිකරනුයේ නිරායාසයෙන් ම නොව එහි අතුරු ප්‍රතිඵල පිළිබඳ අවබෝධයක් ද ඇතිවීම කණගාටුදයක කරුණකි. විශේෂයෙන් ම මෙය ගෘහාශ්‍රිතව නිරමාණය වන්නක් බව නාගරික මං මාවත් ඔස්සේ හොඳ සිහියෙන් යුක්තව ගමන් කරන්නකුට අමුතුවෙන් කිවයුතු නැත.

නාගරික කැලිකසළ ගැටළුවට පරිසර හිතකාමී පිළිවෙතක දැඩි අවශ්‍යතාවක් පවතින යුගයක එම අරමුණ කරා ජනතාව මෙහෙයවීමට කැපවී සිටින සංවිධානයක් ලෙස නාවල රාජගිරියේ පිහිටි "සෙවණත" නාගරික සම්පත් මධ්‍යස්ථානය හඳුන්වා දිය හැකි ය. 1989 වර්ෂයේ දී නාගරික වතු ජනාවාස හිමියන්ගේ ඉඩම් නිත්‍යානුකූල කර,ප්‍රජාවට ජීවත් වීමට සුදුසු පරිසරයක් ගොඩ නැගීම අරමුණු කරගනිමින් ඇරඹුණු මෙම ආයතනය වර්තමතානය වන විට පාරිසරික ගැටළු අවම කිරීමෙහිලා මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව කටයුතු කරමින් සිටියි.

නාගරික කුණු කසළ ගැටළු වට තිරසාර විසඳුමක් ලෙස "සෙවණත" සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අතර

* ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් හඳුන්වා දීම
* කොළඹ නගරය ආශ්‍රිතව ක්‍රියාත්මක වන ප්‍රජා කසළ කළමනාකාරණ ව්‍යාපෘතිය
* නොදිරන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ආරම්භ කිරීම
* වෙරළාශ්‍රිතව ක්‍රියාත්මක වන වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහන, වැදගත් තැනක් උසුලයි.

සෙවණත සංවිධානය මගින් ලබාදෙන ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන භාවිතයේ දී ප්‍රධාන වශයෙන් නිවසින් බැහැර කරනු ලබන කසළ දිරන නොදිරන ලෙස වර්ගකර ඉන් දිරාපත් වන මුළුතැන් ගෙයින් ඉවතලන එළවළු , පලතුරු කොටස්, තේ කුඩු, පොල්කුඩු ආදිය ද ගස්වල කොළ ලී කුඩු ආදිය ද මෙම නව කොම්පොස්ට් බඳුනට දිනපතා බැහැර කළ යුතු ය. සති 2ක් පමණ ඇතුළත ක්ෂුද්‍ර ජීවින් ගේ බෝවීම සිදු වේ. ඒ සමගම කොම්පෝස්ට් ක්‍රියාවලිය ද ආරම්භ වේ.

මුළුතැන් ගෙයින් ඉවතලන කසළ වල නයිට්‍රජන් ප්‍රතිශතය වැඩි බැවින් එයට වියළි කොළරොඩු, ලී කුඩු ආදි කාබන් මිශ්‍ර ද්‍රව්‍ය එක්කිරීමෙන් ඉතාම හොඳ තත්ත්වයේ කොම්පෝස්ට් නිෂ්පාදනය කරගත හැකි වේ. මෙහිදී කොම්පෝස්ට් ක්‍රියාවලිය සඳහා ඔක්සිජන් වායුව ද අත්‍යවශ්‍ය බැවින් කුමන හෝ ආධාරකයක් මගින් කුණු මිශ්‍රකොට ඔක්සිජන් ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට හැකි අයුරින් මෙම බඳුන නිර්මාණය කර ඇත.



කොළඹ නගරය තුළ දිනකට එක්රැස් වන කුණු කසළ ප්‍රමාණය ටොන් 670 කි. ඉන් 83% ක් ම දිරාපත්වන කසළ බව සමීක්ෂණ මගින් හෙළි වී ඇත. මෙය දිනෙන් දින වැඩිවන අතර නගර සභාව විසින් මෙම කසළ ප්‍රමාණය ක්‍රමවත්ව බැහැර කිරීමට විවිධ උත්සාහයන් ගනිමින් සිටියි. එහි එක් පියවරක් ලෙස කොළඹ නගරයේ කිරුළපන, පාමංකඩ නාගරික කලාප 2 තුළ කසළ ප්‍රතිචක්‍රීකරණ හා කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් සැලසුම් කර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම "සෙවණත" සංවිධානයට භාර දී ඇත.

ප්‍රජා සහභාගිත්වය තුලින් තිරසාර කසළ කළමනාකරණ වැඩසටහනක් ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීම අරමුණු කරගනිමින් දැනුවත් කිරීම කොන්ක්‍රිට් කොම්පෝස්ට් බඳුන් බෙද හැරීමටත්, නොදිරන කසළ විවිධ වර්ග යටතේ එක් රැස් කිරීමත් මෙම ව්‍යාපෘතිය තුළින් සිදුවේ.





නොදිරන කුණු කසළ කඩදාසි, වීදුරු, පොලිතීන් ලෙස වර්ග කර ඒ සඳහා වෙනම නිල්, රතු , දුඹුරු ආදි ලෙස වර්ණ ගැන්වූ පොලිසැක්ස් කවර 3ක් ව්‍යාපෘතිය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

නොදිරන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා සහ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන "සෙවණත" මගින් අරම්භ කර තිබීම ද තවත් පරිසර හිතකාමී කටයුත්තකි. මෙහිදී නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කරනු ලබන ආයතන සඳහා යොමු කිරීමට පහසුවන ආකාරයට ද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම, වර්ග කිරීම, පිරිසිදු කිරීම, හා අදාළ ද්‍රව්‍ය එකී ආයතන වෙත යොමු කිරීම ද කරනු ලබයි. මෙහිදී ඊට අවශ්‍ය පරිදි වෙන් කරන ලද ද්‍රව්‍ය අලෙවි කළ හැකි ආකාරයට සකස් කිරීම ද, අලෙවි කිරීමට අවශ්‍ය ප්‍රමාණය එකතු කිරීමෙන් පසු ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආයතන වෙත ගෙන ගොස් අලෙවි කිරීම යනාදී කාර්යයන්ද "සෙවණත" මගින් සිදුකරනු ලබන මහඟු සේවාවන් ය. මීට අමතරව දැනුවත් කිරීම උදෙසා වීඩියෝ පට අත්පත්‍රිකා බෙද හැරීම ද පළාත්පාලන ආයතන සඳහා ද උපදේශන සේවා සැපයීම ද සෙවණත මගින් ඉටු කෙරේ. මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය ද, මධ්‍යම පරිසර අධිකාරියද, නාගරික දිළිඳුකම පිටුදැකීමේ සංවිධානය ද සමග සහයෝගයෙන් කටයුතු කරයි.


මීගමු කලපු සංරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ද "සෙවණත" සංවිධානය මගින් ක්‍රියාත්මක කරවන්නකි.

ලංකාවේ ජෛව විවිධත්වයෙන් හෙබි සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභ දෙන්නාවූ මෙම මීගමු කලපුව ධීවරයින් 3500 කට පමණ ජීවන මාර්ග සපයා දෙයි. එහෙත් දිනෙන් දින නගර සභා කැලි කසළ කර්මාන්තශාලා අපද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය, වැසිකිළි අපද්‍රව්‍ය, ධීවර යාත්‍රා මගින් බැහැරවන අපද්‍රව්‍ය නිසා මෙම කලපුව පාරිසරික පරිහානියකට ලක්වෙමින් පවතී. මෙයට පිළියම් වශයෙන් සෙවණත සංවිධානය මගින් මීගමුව, කටාන, වත්තල හා ජා ඇල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 40ක් මෙම ව්‍යාපෘති බලප්‍රදේශයට ඇතුළත් කර ඇත.

**ප්‍රජා සහභාගිත්වය තුලින් තිරසාර කසළ කළමනාකරණ වැඩසටහනක් ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීම අරමුණු කරගනිමින් දැනුවත් කිරීම කොන්ක්‍රිට් කොම්පෝස්ට් බඳුන් බෙදා හැරීමටත්, නොදිරන කසළ විවිධ වර්ග යටතේ එක් රැස් කිරීමත් මෙම ව්‍යාපෘතිය තුළින් සිදුවේ.**

විවිධ දැනුවත් කිරීම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසල් කේන්ද්‍රකොට ගෙන ආරම්භ කිරීම ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ජංගම ප්‍රචාරක වැඩසටහන් මඟින් ප්‍රජාව අතරට තොරතුරු ගෙන යෑම ආදිය සිදුකරයි.

මෙහිදී වෙළඳ පොළ මත්ස්‍ය අපද්‍රව්‍ය කළමනාකරණ උදෙසා ජීවවායු තාක්ෂණය හඳුන්වාදීම, ප්‍රචලිත කිරීම හෝ කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට සහාය වීම, වැසිකිළි අපද්‍රව්‍ය කලපුවට බැහැර කිරීම වැලැක්වීම සඳහා ක්‍රමවේද සැලසුම් කිරීම කර්මාන්තශාලා අපද්‍රව්‍ය, ද්‍රවිතෙල් බැහැරකිරීමට ඉඩ නොතැබීම හා එක්රැස් කිරීමට අවශ්‍ය ක්‍රමවේද ආදිය ගොඩනැගීම ආදි පරිසර හිතකාමී කටයුතු රැසක් මෙම ව්‍යාපෘතිය තුළින් "සෙවණත" ආයතනය ඉටුකර ගැනීමට ඉලක්ක කරගෙන ඇත.



ස්වභාවධර්මයට හිතැති ආයතනයක් ලෙස "සෙවණත" නාගරික සම්පත් මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන මෙම මහඟු සත්කාරය අනාගත නාගරික පරිසරය මිනිසාට වඩාත් සුදුසු අයුරින් ගොඩනැගීමට මහඟු පිටිවහලක් වනු ඇත.

❑

**මනෝජා අබේසේකර**